# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: **08/2016**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 ජූනි මස 14 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය - ( වෛද්‍ය/ දන්ත වෛද්‍ය) සහ (වෛද්‍ය / දන්ත වෛද්‍ය)-නොවන තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි සඳහා සංශෝධන</u>**

2012.10.09 දිනැති අංක 996 චක්‍රලේඛය මගින් සංශෝධිත 1997.11.21 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි ඇතුළත් අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි දැනට පවත්නා බඳවා ගැනීම් පරිපාටි කෙරෙහි සහ උක්ත කරුණ සම්බන්ධයෙන් වන 2013.01.28 දිනැති අංක 01/2013 සහ 2015.09.07 දිනැති අංක 11/2015 යන කොමිෂන් සභා චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2013 ප්‍රකාරව පශ්චාත් උපාධියක් ලබා ගත් / ඒ සඳහා ලියාපදිංචි වූ (ආධුනික) කථිකාචාර්යවරුන්, කථිකාචාර්ය (ආධුනික) තනතුරෙහි ස්ථිර කිරීම සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කිරීම යන කරුණු දෙකම සඳහා සළකා බැලීමට අවස්ථාව සැලසීම සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 11/2015 හි 05 ඡේදයෙහි නිරූපිත විධිවිධාන සංශෝධනය කිරීමට 2016.03.10 දින පැවැති සිය 936වන සභා වාරයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

03. කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය, ( වෛද්‍ය/ දන්ත වෛද්‍ය) සහ [(වෛද්‍ය / දන්ත වෛද්‍ය)-නොවන] තනතුරු සඳහා බඳවා ගැනීම හෝ උසස් කිරීම සඳහා සහ කථිකාචාර්යවරයෙකුගේ (ආධුනික) සේවා ස්ථිරත්වය සඳහා සහ සංක්‍රාන්තිය විධිවිධාන මත U-AC 3 (III) වැටුප් පරිමාණයේ පිහිටුවීම සඳහා, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 11/2015 හි සඳහන් පශ්චාත් උපාධි අවශ්‍යතාව පහත පරිදි නොවෙනස්ව පවතිනු ඇත.

(අ) (i) අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක්

හෝ

(ii) අවම වශයෙන් මාස 24ක පූර්ණ කාලීන අධ්‍යයන කාලයකින් පසු ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය (හෝ ඒ හා සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) සමඟ නිබන්ධනයක් ආකාරයෙන් සිදු කරන ලද පර්යේෂණ සංරචකයක්

හෝ

(iii) නිබන්ධනයක් ආකාරයෙන් සිදු කරන ලද පර්යේෂණය ක්‍රෙඩිට්* 15 කට නො අඩු වන පරිදි අවමයෙන් ක්‍රෙඩිට්* 60කින් යුත් අවම වශයෙන් මාස 18ක කාල සීමාවකින් යුත් අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන පශ්චාත් උපාධියක්

[*පාඨමාලා ඒකකයකට / මොඩියුලයකට ලබා දෙනු ලබන එක් ක්‍රෙඩිට් ඒකකය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව හා අනුකූල විය යුතුය]

<u>(ආ) විද්‍යා / ව්‍යවහාරික විද්‍යා/ ඉංජිනේරු/ කෘෂිකර්ම පීඨවල නම්:</u>

(i) අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක්

හෝ

(ii) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය සමඟ අවම වශයෙන් මාස 24ක කාලයකින් යුත් පූර්ණ කාලීන පර්යේෂණය

2 පිටුවට....

04. සියලුම පීඨවල, අවම වශයෙන් එක් අවුරුදු කාල සීමාවකින් යුත් අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන පශ්චාත් උපාධියක් ලබා තිබීම කථිකාචාර්යවරයෙකුගේ (ආධුනික) සේවා ස්ථිරත්වය සඳහා සහ U-AC 3 (III) වැටුප් පරිමාණයේ පිහිටුවීම සඳහා පමණක් ප්‍රමාණවත් සුදුසුකමක් වනු ඇත. කෙසේ වුවද, එවැනි පශ්චාත් උපාධියක් සඳහා ලියාපදිංචි වීමට ප්‍රථමව, අධ්‍යයනාංශ ප්‍රධානී, අදාළ පීඨයේ පීඨාධිපති, සහ උප කුලපතිවරයාගේ නිර්දේශය මත උපාධියේ අදාළතාව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කළ යුතුය. පාලක සභාවේ අනුමැතිය, පාඨමාලා විස්තර සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන මණ්ඩලයේ නිර්දේශය සඳහා යොමු කළ යුතු අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවසන් අනුමැතිය ලබා දෙනු ඇත.

5. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2013 හි විධිවිධාන යටතේ 2013.01.01 සිට 2015.09.30 දින දක්වා වූ කාල පරිච්ඡේදය ඇතුළත පශ්චාත් උපාධියක් ලබා ගෙන ඇති / ඒ සඳහා ලියාපදිංචි වී ඇති නමුත් මෙම චක්‍රලේඛයේ ඉහත 3 ඡේදයේ දක්වා ඇති පරිදි අදාළ අවශ්‍යතා සපුරා නොමැති කථිකාචාර්යවරයෙකු (ආධුනික), නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇත්නම් සහ සේවය ස්ථිර කිරීම සහ /හෝ උසස් කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් එම පශ්චාත් උපාධිය පදනම් කර ගෙන ඔහු /ඇය සේවය ස්ථිර කිරීමට සහ /හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කිරීමට සළකා බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

06. තවද, කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීති, සහ කළමනාකරණ / ව්‍යාපාර අධ්‍යයන පීඨවල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2013 ක්‍රියාත්මක වන දිනයට පූර්ව දිනය වන 2012.12.31 දිනට කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 ප්‍රකාරව බඳවා ගත් සහ එහි නිරූපිත පරිදි එක් අවුරුදු පශ්චාත් උපාධියක් ලබා ගත් / ඒ සඳහා ලියාපදිංචි වූ කථිකාචාර්යවරයෙකු (ආධුනික), කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි විධිවිධාන පරිදි ම තනතුරෙහි ස්ථිර කිරීමට සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා උසස් කිරීම සඳහා සළකා බැලීමට අවසර ලබනු ඇත.

07. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2015.10.01 දින සිට ක්‍රියාත්මක වනු ඇති අතර 2015.09.07 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 11/2015, 2015.09.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කෙරේ. තවද, 2013.01.28 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2013, ඉහත 5 ඡේදයට යටත්ව ක්‍රියාත්මක නොවේ.

08. කරුණාකර ඒ අනුව ක්‍රියා කිරීමට සහ මෙම නිවේදනය අදාළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අවධානයට යොමු කිරීමට කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී/එච්ආර්/2/3/106

ටී /-